# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,504 — 1965 සැප්තැම්බර් 11 වැනි සෙනසුරාද — 1965.9.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## පළාත් පාලන නිවේදන

### ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 සැප්තැම්බර් මස 8 වැනි දින,
කොළඹ දී ය.

#### ආඥාව

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 වැනි වගන්තිය යටතේ සම්පාදිතව මෙම ගැසට් පත්‍රයේ පළ කරන ලද ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ආලන්කර්නි හා කුරින්චකර්නි ගම්ප්‍රදේශවලට අදාළ නිවේදනයේ (1), (2) හා (3) වැනි ඡේදවල විධිවිධාන—

(1) ඒ විධිවිධාන 1966 වර්ෂයේ පැවැත්වීමට නියමිත, යථොක්ත එක් එක් ගම්ප්‍රදේශයේ ගම්සභාවට සභිකයින් තෝරා පත්කර ගැනීමේ මහා ඡන්ද විමසීමට සම්බන්ධ යම් කරුණකට අදාළ වන ප්‍රමාණයට මේ ආඥාව ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු ය; තවද

(2) ඒ විධිවිධාන වෙනයම් කරුණකට අදාළ වන ප්‍රමාණයට 1966 පෙබරවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

9-631/1

---

### ගම්සභා ආඥාපනත

#### නිවේදනය

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වෙනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම් වන මම, මෙයින්—

(1) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ආලන්කර්නි ගම් ප්‍රදේශයෙහි දැනට පවත්නා ඡන්ද කොට්ඨාශ මීට යා කොට ඇති පළමු වෙනි උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් සීමාසහිත වූ ඡන්ද කොට්ඨාශවලට අනු කොටස්කර බෙදමි;

(2) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කුරුන්චකර්නි ගම් ප්‍රදේශයෙහි දැනට පවත්නා ඡන්ද කොට්ඨාශ මීට යා කොට ඇති දෙවෙනි උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් සීමාසහිත වූ ඡන්ද කොට්ඨාශවලට අනු කොටස් කර බෙදමි;

(3) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ඇතැම් ගම් ප්‍රදේශයන්හි ග්‍රාම සේවක කොට්ඨාශ ඡන්ද කොට්ඨාශවලට අනු කොටස් කර බෙදීමට අදාළවන්නා වූ ද, 1940 මාර්තු 29 වන දින අංක 8,597 දරන ගැසට් පත්‍රයෙහි පළකරන ලද්දා වූ ද නිවේදනය එහි වූ උපලේඛනයෙහි ඒ නිවේදනය කින්නියා ගම් ප්‍රදේශයට අදාළ වන ප්‍රමාණයට අවලංගු කරමි; තවද

(4) (1) වෙනි, (2) වෙනි හා (3) වෙනි ඡේදවල විධිවිධාන—

(අ) 1966 වර්ෂයෙහි දී පැවැත්වීමට නියමිත ඉහත කී එක් එක් ගම්ප්‍රදේශයෙහි ගම්සභාවේ සභිකයන් තෝරා පත් කර ගැනීමේ මහා ඡන්ද විමසීම හා සම්බන්ධ වූ යම් කරුණකට මෙම විධිවිධාන අදාළ වන ප්‍රමාණයට, මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු ය; තවද

(ආ) මෙම විධිවිධාන අන් කිසි කරුණකට අදාළ වන ප්‍රමාණයට, 1966 පෙබරවාරි මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 සැප්තැම්බර් මස 8 වැනි දින,
කොළඹ දී ය.

### පළමුවැනි උපලේඛනය

#### ආලන්කර්නි ගම් ප්‍රදේශය

| I වැනි තීරය | II වැනි තීරය<br>ඡන්ද කොට්ඨාශ |
| --- | --- |
| අංක 225ඒ දරන ග්‍රාම සේවක කොට්ඨාශය—බටහිර සින්නකින්නිය | අංක 1 දරන ඡන්ද කොට්ඨාශය නැගෙනහිර ආලන්කර්නි වලින් සමන්විත වේ. |
| | අංක 2 දරන ඡන්ද කොට්ඨාශය බටහිර ආලන්කර්නි වලින් සමන්විත වේ. |

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| | ඡන්ද කොට්ඨාශය |
| | අංක 3 දරන ඡන්ද කොට්ඨාශය ඉච්චන්තිවු වලින් සමන්විත වේ. |
| | අංක 4 දරන ඡන්ද කොට්ඨාශය තාමරෙයිවිල් කුඩ්ඩිතිවු නාඩුතිවු වලින් සමන්විත වේ. |
| | අංක 5 දරන ඡන්ද කොට්ඨාශය පූවරසාන් තිවු නෙල් වෙනයි සූන් කන් කුලි වලින් සමන්විත වේ. |
| | අංක 6 දරන ඡන්ද කොට්ඨාශය සමවයිතතිවු සල් ලික් කුලප් පු නෙදුන් තිවු |
| අංක 225 දරන නැගෙනහිර සින්නකින්නිය | අංක 7 දරන ඡන්ද කොට්ඨාශය කණ්ඩලඩිලඉතු වලින් සමන්විත වේ. |
| | අංක 8 දරන ඡන්ද කොට්ඨාශය උප් පාර් ගන් ගෙයි කාරෙයිවිඩ්ඩුවාන් මයිලප් පන් චේනෙයි පනිච්චයියඩිතිවු වලින් සමන්විත වේ. |
| | අංක 9 දරන ඡන්ද කොට්ඨාශය චොලෙයිවේඩ්ඩුවාන් නානලිපුලිමාඩු කණ්ඩල් කාඩු තලවායි වලින් සමන්විත වේ. |

## දෙවැනි උපලේඛනය

### කුරුන්චකර්නි ගම් ප්‍රදේශය

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| | ඡන්ද කොට්ඨාශ |
| අංක 226 ඒ දරන ග්‍රාම සේවක කොට්ඨාශය කුරුන්චකර්නි | අංක 1 දරන ඡන්ද කොට්ඨාශය නැගෙනහිර කුරුන්චකර්නි වලින් සමන්විත වේ. |
| | අංක 2 දරන ඡන්ද කොට්ඨාශය බටහිර කුරුන්චකර්නි වලින් සමන් විත වේ. |
| | අංක 3 දරන ඡන්ද කොට්ඨාශය ආර්කන්ඩිකර්නි වලින් සමන්විත වේ. |
| | අංක 4 දරන ඡන්ද කොට්ඨාශය මූනෙයිචේනයි කුඩ්ඩිතිවු වලින් සමන්විත වේ. |
| | අංක 5 දරන ඡන්ද කොට්ඨාශය පෝනවරසන් තිවු කච්චකොඩිතිවු විල් වෙලි කුඩ්ඩියකුලම් කලුතියොඩයි වලින් සමන්විත වේ. |
| | අංක 6 දරන ඡන්ද කොට්ඨාශය නැගෙනහිර කාක් කමුණයි නඩුතිවු වලින් සමන්විත වේ. |
| | අංක 7 දරන ඡන්ද කොට්ඨාශය බටහිර කාක් කමුණයි කොලිමුඩ්ඩයිකාරච්චෙයි වලින් සමන් විත වේ. |

9-631/2

## ගම්සභා ආඥාපනත

### ආඥාව

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වෙනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 වෙනි හා 10 වෙනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම් වන මම, මේ ආඥාවෙන්—

(1) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කින්නියා ගම් ප්‍රදේශය මීට යා කොට ඇති පළමුවෙනි හා දෙවෙනි උපලේඛනයන්හි පිළිවෙලින් වඩා සම්පූර්ණ ලෙස විස්තර කරනු ලබන ග්‍රාම සේවක කොට්ඨාශවලින් සමන්විත ආලන්කර්නි සහ කුරුන්චකර්නි යන අලුත් ගම්ප්‍රදේශ දෙකකට බෙදා වෙන් කරමි ; තවද

(2) 1966 පෙබරවාරි මස පළමුවෙනි දිනය, ඉහත කී එක් එක් ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබීමට නියමිත ගම්සභාවල නිල කාලය ආරම්භ විය යුතු දිනය වශයෙන් නියම කරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 සැප්තැම්බර් මස 8 වැනි දින,
කොළඹ දී ය.

## පළමුවැනි උපලේඛනය

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත ප්‍රදේශය :—

| | |
|---|---|
| ආලන් කර්නි | සල් ලික් ලුප්පු |
| කණ්ඩලඩිලඉතු | නෙදුන්තිවු |
| ඉච්චන් තිවු | උප්පාර් |
| තාමරෙයිවිල් | ගන් ගයි |
| කුඩ්ඩිතිවු | කාරෙයිවෙඩ්ඩුවානි |
| නාඩුතිවු | මයිලප් පන් චේනෙයි |
| පූවරසන් තිවු | පනිච්චයිදතිවු |
| නෙල් චේනෙයි | චෝලෙයිවෙඩ්ඩුවාන් |
| සූන් කන් කුලි | නානලිපුලිමඩු |
| සමාවයිතතිවු | කණ්ඩල් කඩු |

තලවායි

## දෙවැනි උපලේඛනය

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත ප්‍රදේශය :—

| | |
|---|---|
| කරුන්චකර්නි | විල් වෙලි |
| ආකණ්ඩිකර්නි | කුඩ්ඩියකුලම් |
| මූනෙයිචේනයි | කලුතිඔඩයි |
| කුඩ්ඩිතිවු | කක් කාමුආයි |
| පොන් නවරාසාන් තිවු | නාඩුතිවු |
| කච්චකොඩිතිවු | කොලිමුඩ්ඩිකාරච්චෙයි |

9-631/3

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි